# කැලණිය විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව
## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) 2012/2013
2015 දෙසැම්බර් /2016 පෙබරවාරි
මානවශාස්ත්‍ර පීඨය

**සිංහල -SINH E 1015**

නාට්‍ය කලාව, නූතන සිංහල කාව්‍ය හා ප්‍රබන්ධ කථා
(පැරණි සහ නව නිර්දේශ)

පළමුවන ප්‍රශ්නය ද, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට(05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව: 09 යි. කාලය: පැය 03 යි.

1 කොටස

01. පහත සඳහන් පද්‍ය නිර්මාණය රසාස්වාදය කරන්න.

වීදි සරනා මවක දුටුවෙමි
දෑස කඳුලින් තෙමී අඳවුණ
ඇගේ ළමැදෙහි ගුලිව නිහඬව
නොමළ බිළිඳෙකි සෙමෙන් මියයන

කිසා ගෝතමියක ලෙසින් ඇය
ලොවට අත පා අයැද සිටියේ
මියැදි බිළිඳුට නැවත පණ නොව
මියෙන පොඩි පුතු රකින මගකිය

මංසලෙන් සල නැගු තොරණින්
මහරු සම්බුදු සිරිත දිස් විය
උවසු උවැසිය ගැයූ බැති ගී
අරම පිස වා ගැබට එක් විය

නැගෙන සැණකෙළි හඬින් සිව් දෙස
පිරී අබිසෙස් ලැබී සොම්නස
විදුලි එළියෙන් පුරය එකළුව
අසිරිමත් සුර ලොවක් බිහි විය

රැයෙහි මැදියම ගෙවෙන මොහොතෙහි
දනන් කෙළි ලොල් හඬ නිමාවිය
මවක් ඉකි බිඳ වැළපෙනා හඬ
පාලු වීදිය වසා මතු විය

## 11 කොටස

02. ''කොළඹ යුගයේ මුල් පරපුරට අයත් කවීන්ගේ නිර්මාණ අතරින් ළමා පද්‍ය රචනා වඩාත් සාධනීය මට්ටමක පවතී'' මේ මතය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

03. කාලීන සමාජ යථාර්ථ ගවේෂණය, 70 දශකයේ සිට බිහි වූ බොහෝ කාව්‍ය නිර්මාණයන්හි මුඛ්‍ය තේමාව වූ අයුරු නිදර්ශනාශ්‍රයෙන් පරීක්ෂා කරන්න.

**නැතහොත්**

පහත සඳහන් කවීන් අතරින් **එක් අයකුගේ** කාව්‍ය නිර්මාණ පිළිබඳ ප්‍රමාණවත් අගැයීමක් කරන්න.

1. විමලරත්න කුමාරගම
11. සිරි ගුණසිංහ
111. මහගම සේකර
1v. මොනිකා රුවන් පතිරණ

04. සංස්කෘත නාට්‍ය සංදර්භය හා බැඳුණු ප්‍රධාන අවස්ථා නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

05. ''ස්වතන්ත්‍ර ලේඛකයකුගේ ස්වාධීන කවිත්වය ප්‍රකට කරන රසවත් නිර්මාණයක් ලෙස **රත්නාවලී** නාටකය හඳුනා ගත හැකිය'' විමසන්න.

## 111 කොටස

06. සිංහල කෙටිකතාව දහනව වන සියවසේ දෙවන භාගයේ මෙරට ඇති වූ භාෂා ශාස්ත්‍ර හා ශාස්ත්‍රීය ප්‍රබෝධයේ ප්‍රතිඵලයකැ'යි පැවසෙන මතයෙහි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

07. පහත සඳහන් කෙටිකතාවලින් **එක් කෙටිකතාවක්** විචාරයට ලක් කරන්න.

**(නව නිර්දේශය)**

1. වැස්ස වහිනවා
11. ගමනාන්තය
111 රන්සිනා ඉන්නවා
1v. පටාචාරා

**(පැරණි නිර්දේශය)**

1. කෙස්වැටිය
11. අපටත් වැසිකිළියක්
111. ස්නේහය
1v. ගල් පිළිමය හා බොල් පිළිමය

08. ''කාලීන සමාජ පරිවර්තන මැනවින් ග්‍රහණය කරගත් නවකතාකරුවා මාර්ටින් වික්‍රමසිංහ යි'' තුනු ඇඳුතු නවකතා ඇසුරින් විභාග කරන්න.

09. මිණිවන් පී. තිලකරත්නයන්ගේ ප්‍රතිනිර්මාණ ශක්‍යතාව **තෘෂ්ණාහරණ** කවකතාව ඇසුරින් විමසන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි.)